කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**බාහිර විභාග අංශය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

(2010 මැයි / ජූනි)

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල - SINH E 2015**

සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමා

**එක් කොටසකින් එක් ප්‍රශ්නයක් බැගින්වත් තෝරා ගෙන**
**ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි　　　　　　　　　　කාලය : පැය 03 යි

---

**නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.**

**I කොටස**

01. පහත සඳහන් ඡේදය ලිහිල් බසින් ලියා අවස්ථා සම්බන්ධය දක්වන්න.

එ රාජ කුමාරයා ආළවක යක්ෂයා කරා ගෙනැ ගිය රාජ පුරුෂයො එ විමානයෙහි සාධුකර හඬ අසාලා 'අනෙ, නො ඇසූවිරූ දෙයෙකැ, ආළවකයාගෙ විමානයෙහි සාධුකාර හඬෙකැ ඇසෙන්නෙ. දියෙන් ගිනි නොනැඟෙයි, ගිනිකඳින් දියබිඳු නොඉසෙයි', යුගාන්තකාලයෙහි හිරු රැසින් අමා නොවැගිරෙයි, නරකයෙහි දිව විමන් නොවෙයි, සර්පයන්ගෙ දළැ ඖෂධ නොතිබෙයි, ආළවකයාගෙ විමානයෙහි සාධුකාර හඬෙක් නම් නැත. අද මෙ කුමන විස්මයෙක් දො හො, අපගෙ ශුද්ධොදන රජ්ජුරුවන්ගෙ පුතණුවන් වහන්සෙ යම්සෙ මොබ වැඩි සෙයෙක් දෝ හො' යි විමසා බලා නුගගසැ අතු අතුරින් නැඟෙන බුදුරස් දැකැ ඇතු වැළැකීමෙහි මෙහෙයීමෙහි සමර්ථ ආරොහකයකු ඇතු පිටැහුන් කලැ 'මෙආරොහකයා ඇතු වළකාගන්නි, සිතා ඇතු ළඟට නො බා වදනා ඇත්ගොවුවන් සෙ පෙරැ සිටිනා හිම ඉක්මැ-ගෙනැ, නොබා ඇතුළට වන්හු, වැඩහුන් සර්වඥයන් වහන්සෙ දුටිහ. ඇඳිලි බැඳැගෙනැ සිටි ආළවකයා දුටිහ. තාගෙ බිලිය තොගනැ'යි කියා කුමාරයා ආළවකයාට දුන්හැ. ආළවක තෙමෙ ලජ්ජායෙන් කුමාරයා දෝතින් පිළිගෙනැ බුදුන් වහන්සෙට කියන්නෙ"ස්වාමීනි, මෙ මට බිලියමට ගෙනා කුමාරයෙකැ, මෙ කුමාරයාට හිත සුව පිණිසැ පිළිගෙනැ වදාළ මැනැවැ' යි කියා බුදුන් වහන්සෙගෙ ශ්‍රී හස්තයෙහි පිළිගැන්වී යැ. එ කුමාර ශ්‍රී හස්තයෙන් පිළිගෙනැ වදාරා "මෙ කුමරා දිගා වේවා" යි " යක්ෂය, තො ද සුවපත්වේ වා" යි කියා වදාළ සෙයෙක. යක්ෂ ද කුමාරයා තෙසරණ ගැන්වී යැ. සර්වඥයන් වහන්සෙ ' මූ වඩාලා අපටමැ දෙව' යි කියා කුමාරයා ගෙනා රාජ පුරුෂයනට මැ දෙවා වදාළ සේක.

02. චිත්තාකර්ෂණීය විලාසයකින් කථා ඉදිරිපත් කිරීමට දඹදෙණි යුගයේ ග්‍රන්ථ කර්තෘවරුන් දක් වූ ශක්‍යතාව පහදන්න.

**නැතහොත්**

ශ්‍රාවක සමාජය අරමුණු කොට ගෙන රසවත් ලෙස කථා කීමේ කලාව **සද්ධර්මරත්නාවලී** කතුවරයන් වහන්සේ භාවිතයට ගත් ආකාරය පැහැදිලි කරන්න.

03. චරිත නිරූපණයෙහි ලා **බුත්සරණ** කතුවරයා දක්වූ කුසලතාව වෙස්සන්තර ජාතක කථාව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

## II කොටස

04. යටත් විජිත යුගයේ පරිපාලන නිලධාරියකු ලෙසින් තමන් ලැබූ අත්දැකීම් ආශ්‍රයෙන් සමකාලීන සමාජය විනිවිද දැකීමට ලෙනාර්ඩ් වුල්ෆ් සමත් වූ ආකාරය **බැද්දේගම** නවකථාව ආශ්‍රයෙන් විමසන්න.

05. **විලාසිනියකගේ ප්‍රේමය** නවකථාවේ සාමාගේ චරිතය නිරූපණයේ දී සරච්චන්ද්‍ර හෙළූ දෘෂ්ටිය කෙබඳු වී දැයි පරීක්ෂා කරන්න.

**නැතහොත්**

**තාපපටලය** කෙටි කථා සංග්‍රහයේ දී මදුරසිංහ ගුණතිලක ස්වකීය මාධ්‍යය සමාජ, දේශපාලන විමර්ශනයන් සඳහා ඉවහල් කරගත් ආකාරය නිදර්ශනාත්මක ව පරීක්ෂා කරන්න.

## III කොටස

06. පූජාර්ථයෙන් තොර ව හුදු විනෝදාර්ථය සඳහා ම කෝලම් නාටකය බිහි වූයේ යැයි සන්නියකුම ආදර්ශ කොටගෙන සරච්චන්ද්‍ර ඉදිරිපත් කළ මතයෙහි යුක්ත යුක්ත භාවය පහදන්න.

**නැතහොත්,**

"සිංහල කවිනළුව (නාඩගම) ප්‍රභවයෙහි ලා කතෝලික මිෂනාරි ව්‍යාපාරයෙන් බලපෑමක් සිදු නො වී ය"

පූර්වෝක්ත ප්‍රකාශයට ඔබ එකඟ වන්නෙහි ද?

07. "**සිංහබාහු** නාටකයෙන් පිළිබිඹු වන්නේ මධ්‍යම පාන්තික කුටුම්බයේ ඛේදවාචකයයි"
මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

08. ශෝකජනක නාට්‍යයක් ලෙසින් **ප්‍රොමිතියස් බන්ධනය** ඇගයීමට ලක් කරන්න.

09. "වෙනත් සාහිත්‍යාංග සමග සංසන්දනය කිරීමේ දී චිත්‍රපටය ඊට ම ආවේණික ප්‍රකාශන රීතියක් ප්‍රකට කරයි " විමසන්න.

10. "ප්‍රකාශන ශක්‍යතාව හා කලාත්මක පරිපූර්ණත්වය යන අංගයන්ගෙන් **රෂොමොන්** චිත්‍රපටය ඊට පාදක වූ සාහිත්‍ය මූලාශ්‍රය ඉක්මවා සිටියි." සාකච්ඡා කරන්න.

******************